# රෝසිට මිතුරෙක්



සෙතුල්‍යා සේනානායක (3 ශ්‍රේණිය B)

මහමායා බාලිකා විදුහල - මහනුවර

එකෝමත් එක ගෙදරක ලස්සන ගැහැණු ළමයෙක් සිටියා. එයාගේ නම බටිති. තාත්තා දවසක් අසරණ වූ කුරුළු පැටියෙක් ගෙදරට ගෙනාවා. බටිතිට හරි සතුටුයි. එයාව කූඩුවක දැම්මේ නැහැ. එයා සතුටින් හැදුණා.



බට්ටිගේ හොඳම යහළුවා එහා ගෙදර මිහිරි. මිහිරි සෙල්ලම් කරන්න, පාඩම් කරන්න එන විට එයාගේ පිටු පසින් ලස්සන පුලුන් බෝලයක් එනවා. ඒ තමයි මිහිරිගේ සුරතල් පූස් පැටියා රෝසි. මිහිරියි, රෝසියි බට්ටිගේ ගෙදර එනවට එයා හරි ආසයි. ඒත් දැන්නම් බට්ටිගේ හිතට හරි බයයි. මිහිරිගේ පූස් පැටියා එක්කරගෙන එන්න එපා කිව්වොත් තරහ වෙයිද? බට්ටි කල්පනා කළා.

ඒ අතර බට්ටිගේ ගෙදරට මිහිරි ආවා. බට්ටි මොකද බර කල්පනාවක? ආ.... මිහිරි ඔයාගේ පූස් පැටියා රෝසි කුරුල්ලෝ අල්ලනවා දැකලා තියනවා ද? අනේ නෑ එයා සමනල්ලු පිටුපසින් දුවනවා දැකලා තියෙනවා.



එතකොට බට්ටිගේ කුරුලු පැටියා පියඹලා ඇවිත් රෝසිගේ පිට උඩ වැහුවා.



රෝසියි, කුරුළු පැටියයි

දෙන්නම සතුටින්

සෙල්ලම් කළා. බට්ටියි.

මිහිරියි වගේම පූස්

පැටියයි, කුරුළු

පැටියයි හරි සතුටින්

සෙල්ලම් කළා.

